විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක : 06/2020

මගේඅංක : විවැ/චක්‍රලේඛ/2020
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත, කොළඹ 10
2020.06.09

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>ගෝලීය කොරෝනා වෛරස් වසංගත තත්වය තුළ නිවසේ සිට රාජකාරි කටයුතු ඉටු කිරීමේ වැඩපිළිවෙලක් (WFH) මගින් රජයේ සේවාවන් සැපයීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2020.04.20 දිනැතිව මවිසින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 05/2020 හා බැඳේ.

02. ගෝලීය කොරෝනා වෛරස් වසංගත තත්වය හේතුවෙන් තැපැල් කටයුතු අක්‍රීය වීම මත පසුගිය කාලපරිච්ඡේදය තුළ විශ්‍රාම වැටුප් අයදුම්පත් තැපැල මාර්ගයෙන් එවීමට හැකියාවක් නොමැති වූ බැවින් එම අයදුම්පත් මාර්ගගත පද්ධතිය ඔස්සේ (online) යොමු කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

03. වර්තමානය වන විට වසංගත තත්වය සමනය වී තැපැල සක්‍රීය වී ඇති බැවින් විශ්‍රාම වැටුප් අයදුම්පත් පෙර පරිදිම තැපැල් මාර්ගයෙන් යොමු කිරීමේ හැකියාව ඇත. එම නිසා 2020.06.10 වන දින සිට අදාළ පද්ධතිය අක්‍රීය කිරීමට කටයුතු කරන අතර විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2016 (සංශෝධන I) අනුව විශ්‍රාම වැටුප් අයදුම්පත් තැපැල මගින් එවීමට කටයුතු කල යුතුය.

04. 2020.04.20 දිනැතිව මවිසින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 05/2020 මින් අවලංගු කරන බව ද කාරුණිකව දන්වමි.

**ඒ.ජගත්.ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :
1. ජනාධිපති ලේකම් - කාරුණික දැන ගැනීම සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැන ගැනීම සඳහා
3. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
4. ලේකම්, මුදල් ,ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
5. විගණකාධිපති - අවශ්‍ය කටයුතු සඳහා